විශ්‍රාම වැටුප් චක්‍රලේඛ : 03/2021 (සංශෝධන I)

මගේ අංක : විවැ/චක්‍රලේඛ 2023
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10.
2023.12. 28

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ත්‍රිවිධ හමුදාධිපතිවරුන්/පොලිස්පති
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>යුධමය වාතාවරණය පැවති වකවානුවේ මියගිය ත්‍රිවිධ හමුදා සහ විශේෂ කාර්ය බලකා ඇතුළු ශ්‍රී ලංකා පොලිස් සාමාජිකයන්ගේ යැපෙන්නන් වෙත සහන හිමිගැන්වීම</u>**

උක්ත කරුණ සම්බන්ධව මා විසින් නිකුත් කරන ලද 2020.07.22 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2021 හි, ත්‍රිවිධ හමුදා හා ශ්‍රී ලංකා පොලිසිය වෙත නිකුත් කර ඇති උපදෙස් යටතේ ඇති III ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

> "ත්‍රස්තවාදී හේතූන් මත හෝ මෙහෙයුම් රාජකාරී මත මියයාම හේතුවෙන් වන්දි වැටුප් හිමිගන්වනු ලැබූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුව, වැන්දඹුවන්ගේ/ වැන්දඹු පුරුෂයන්ගේ හා අනත්දරුවන්ගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත අයදුම්පත් යොමු කළ යුතු අතර ප්‍රතිශෝධනය කිරීමෙන් පසුව ස්ථාවර දීමනා ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත යොමු කළ යුතු ය."

02. තවද, ඉහත චක්‍රලේඛයේ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කර ඇති උපදෙස් යටතේ ඇති v ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

> "ත්‍රස්තවාදී හේතූන් මත හෝ මෙහෙයුම් රාජකාරී මත මියයාම හේතුවෙන් වන්දි වැටුප් හිමිගන්වනු ලැබූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සාමාජිකයන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසු වැන්දඹුවන් / වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන්, ප්‍රතිශෝධිත වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපේ පිහිටුවීම හා හිඟ මුදල් ගෙවීම සඳහා අදාළ ආයතනයෙන් අයදුම්පත ලැබීමෙන් අනතුරුව ප්‍රතිශෝධනය සහිතව ඔබ විසින් 55 W & OP Revision යටතේ හිඟ ගෙවීම් පිළිබඳ වාර්තාව (AR) යොමු කළ යුතු ය. මෙම ප්‍රතිශෝධනය සිදු කිරීමේ දී මේ හා සබැඳි යැපෙන්නන්ගේ දීමනා ගෙවීම් පිළිබඳ නිරවද්‍යතාවය ද පරීක්ෂා කිරීම කළ යුතු වේ."

03. ඒ අනුව ත්‍රිවිධ හමුදා හා පොලිස් වැන්දඹුවන්ට ස්ථාවර දීමනා හිමිගැන්වීම සහ අදාළ හිඟ ගෙවීම් කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන අතර ඒ සඳහා හිඟ ගෙවීම් පිළිබඳ වාර්තාව (AR) ඉදිරිපත් කිරීම සිදු නොකළ යුතු ය.

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

| | | |
|---|---|---|
| 1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය | - | කරු.දැ.ගැ.ස. |
| 2. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය | - | කරු.දැ.ගැ.ස. |
| 3. ලේකම්, මුදල් අමාත්‍යාංශය | - | කරු.දැ.ගැ.ස. |
| 4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - | කරු.දැ.ගැ.ස. |
| 5. විගණකාධිපති | - | කරු.දැ.ගැ.ස. |